
මුහුදු ජීවීන්

# වඳවී යන තල්මස් පවුලේ දැවැන්තයා



**නිල් තල්මසා BLUEWHALE ලොව වෙසෙන විශාලතම සත්වයායි.එක් කාලයකදී ලෝකයේ සෑම සාගර කලාපයකදීම බහුලව දැකගත හැකි වූ සුන්දර නිල් තල්මසුන් මිනිසුන්ගේ කුරිරු ක්‍රියාකාරකම් හේතුවෙන් ලොවින් තුරන්ව යන සත්ව කොට්ඨාශයක් බවට නම් කළ ද අද වඳවී යන සතුන්ගේ නම් ඇතුළත් රතු ලැයිස්තුවේ නිල් තල්මසාගේ නමත් සඳහන් වේ. තත්වය මෙසේ තිබියදීත් පසුගිය වසරේ ජපානයේ පැවති සමුළුවකදී නිල් තල්මසුන් නැවත දඩයම් කිරීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටියා. එහෙත් ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව ඇතුළු 25 % ක රටවල වැඩි ඡන්දයෙන් එය ප්‍රතික්ෂේප විය. ජපානයට පක්ෂව ඡන්දය භාවිතා කර තිබුණේ තායිලන්තය, කොරියාව වැනි රටවල් කිහිපයක් පමණි.**

## යෝධයාගේ වංශ කතාව

දිය ගොඩ සැම තැන වෙසෙන සතුන් අතුරින් ලොව වෙසෙන විශාලම සත්වයා නිල් තල්මසායි. BALAENOPTERA MUSCULUS යන්න පොදුවේ තල්මසුන් හඳුන්වන විද්‍යාත්මක නාමය යි. තල්මස් පවුලට අයත් විශේෂයන් අතර Hump Back Whale Fin Whale BrydesWhale Sei Whale වැනි විවිධ නම් වලින් හඳුන්වන විශේෂ රාශියක් සිටියි.

ඒ පවුලේ දැවැන්තයා නිල් තල්මසායි. නිල් තල්මසුන් හඳුන්වන්නේ රෝර්කුවල් Rorquals වංශිකයන් ලෙසිනි. එය Furrow නමැති නෝර්වීජියානු වචනයකින් බිඳී ආවකි. එයින් අදහස් වන්නේ දිග තීරු නැත්නම් ඉරි යන්නයි.නිල් තල්මසෙකුගේ සිරුරේ බාහිර කොටසේ නිකටේ සිට නාභිය දක්වාම දිග තීරු වැනි නෙරුම් රාශියක් දක්නට ලැබේ.

එම ස්වභාවය මොවුන් රෝර්කුවල් වංශිකයන් ලෙස හැඳින්වීමට හේතුවී තිබෙනවා. දැවැන්ත වූ බරැති සිරුරක් හිමි වුවත් එහි බර දරාගත හැකි අන්දමේ විශාල ප්‍රමාණ යක අස්ථි පඤ්ජරයක් නිල් තල්මසුනට හිමිවී නැත. මොවුන් මෙන් බරැති විශාල සිරුරක් හිමිව ශක්ති සම්පන්න අස්ථි පද්ධතියක් අහිමිව ගොඩබිම කිසියම් සතෙක් වූයේ නම් ඒ සතා උගේ බරින්ම මියෙනු නිසැකය.

එහෙත්, "කල් දනුනේ දසේ "කඩ මස පිරුණු තැනේ රැල් පුළුනේ බරකුත් බඩට නොදනු තේ"'

හෙළ ජන කවියා කියූ අන්දමට මහමායා දේවින්හට දස එකඩ මසක් කුස තුළ දරා සිටි පින්වත් සිදුහත් කුමරුන්ගේ බර පුළුන් රොදක් තරම්වත් නොදනුනාක් සේ සාගර මාතාවටද නිල් තල්මසුන්ගේ දැවැන්ත පංචස්කන්ධය දිය මතු සිට පාවෙන කුඩා රබර් බෝලයක් සේ සැහැල්ලු ය.

## යෝධ සිරුරේ අසිරිය

නිල් තල්මසා ලොව විශාලතම සත්වයා පමණක්ම නොව ලොව විශාලතම ක්ෂීරපායී සත්ත්වයා ද වෙයි. මොවුන්ට දිග සිරුරක් හිමිවන අතර වරල්පත දක්වා එය ක්‍රමයෙන් සිහින්ව වැඩී තිබේ. දිය මතුපිට වේගයෙන් ගමන් කරන විට දියේ ගැටීම හැකිතාක් අඩුවන සේ හැඩ ගැසුණු සිරුර අහස් නැවක් බඳුය. නිල් තල්මසාගේ මුළු සිරුරෙන් හතරෙන් එකක් පමණ හිස කොටස සඳහා වෙන්වී තිබේ.

හිසේ ඉහළ කොටස විශාල පැතලි හැඩයක් ගනියි. නිල් තල්මසෙකුට මුහුණට මුහුණලා සිටින අයෙකුට නිල් තල්මසාගේ හිස දිස්වන්නේ ඉංග්‍රීසි හෝඩියේ U අකුරේ හැඩයටයි.

හිසේ උඩ කොටසේ එනම් මුව කෙලවරෙහි සිට ක්‍රමයෙන් හිස දෙසට ගමන් කිරීමේදී එහි කෙළවර සිදුරක් සහිත උඩට නෙරාගිය කුඩා කඳු වැටියක් වැනි නෙරුමක් දකිය හැකිය. එහි තිබෙන සිදුරු තුළින් යෝධ මලක් සේ මීටර 20 ක් තරම් උඩට විහිදෙන ජලධාරාවක් විහිදෙයි. මොවුන්ගේ මතුපිට සම සුමුදුය. පරපෝෂිත සතුන්ගෙන් තොරය.

එසේ වුවත් නිල් තල්මසුන්ගේ මුඛය කෙළවර හොම්බ කොටසේත් පිටුපස වරල් පතේත් යාත්‍රා බෙල්ලන් නැතහොත් කවාටි වර්ගයක් ඇලී සිටිනු දකිය හැකියි. මොවුන්ගේ මුඛය විශාලය. යටි හනුව පැත්තෙත් නාභිය දක්වා පැතිර ගොස් තිබේ.

උගුරේ සිට නාභිය දක්වා වූ එම කොටස නිර්මාණය වී ඇත්තේ පීලි වැනි නෙරුම් 55 ත් 65 ත් අතර ප්‍රමාණයකිනි. ආහාර ගන්නා අවස්ථාවන්හි දී එම ඉරි වැනි නෙරුම් දිග හැරීම නැතහොත් ඉහිල්වීම සිදුවේ. එසේ වූ විට ටොන් 1000 ට හෝ ඊට වැඩි ආහාර ප්‍රමාණයක් එකවර මුඛය තුළට ගැනීමට නිල් තල්මසෙකුට හැකියාව තිබෙයි.

**නිල් තල්මසා ලොව විශාලතම සත්වයා පමණක්ම නොව ලොව විශාලතම ක්ෂීරපායි සත්ත්වයා ද වෙයි. මොවුන්ට දිග සිරුරක් හිමිවන අතර වරල්පත දක්වා එය ක්‍රමයෙන් සිහින්ව වැඩී තිබේ. දිය මතුපිට වේගයෙන් ගමන් කරන විට දියේ ගැටීම හැකිතාක් අඩුවන සේ හැඩ ගැසුණු සිරුර අහස් නැවක් බඳුය. නිල් තල්මසාගේ මුළු සිරුරෙන් හතරෙන් එකක් පමණ හිස කොටස සඳහා වෙන්වී තිබේ. හිසේ ඉහළ කොටස විශාල පැතලි හැඩයක් ගනියි. නිල් තල්මසෙකුට මුහුණට මුහුණලා සිටින අයෙකුට නිල් තල්මසාගේ හිස දිස්වන්නේ ඉංග්‍රීසි හෝඩියේ උ අකුරේ හැඩයටයි. හිසේ උඩ කොටසේ එනම් මුව කෙලවරෙහි සිට ක්‍රමයෙන් හිස දෙසට ගමන් කිරීමේදී එහි කෙළවර සිදුරක් සහිත උඩට නෙරාගිය කුඩා කඳු වැටියක් වැනි නෙරුමක් දැකිය හැකිය. එහි තිබෙන සිදුරු තුළින් යෝධ මලක් සේ මීටර 20 ක් තරම් උඩට විහිදෙන ජලධාරාවක් විහිදෙයි. මොවුන්ගේ මතුපිට සම සුමුදුය. පරපෝෂිත සතුන්ගෙන් තොරය.**

## අදහස් හුවමාරුව

කා හටත් ඇහෙන සේ ගැඹුරු සහ ගර්ජනාත්මක ශබ්දයක් නැගීමට නිල් තල්මසුන් සමත්කම් දක්වයි. ඔවුන් නිකුත් කරන කෙටි ශබ්ද තරංග දිය කඳ හරහා දිගු දුරක් ගමන් කරයි. එසේ ගමන් කරන අතරම සැතපුම් සිය ගණනක් දුර සිටින සිය ඥාතීන් සමග අදහස් හුවමාරු කරගැනීමටත් එම ඉඩ ප්‍රමාණවත් වේ.

## පැහැය

නිල් තල්මසුන් සාමාන්‍යයෙන් අළු පාටට හුරු නිල් පැහැයකින් යුක්තය. බොහෝවිට තද පැහැති පසුබිමක තද අලු පැහැති පුල්ලි හෝ ලප වැනි මිශ්‍ර වර්ණයන් ගෙන් යුත් සිරුරක් මොවුන්ට හිමිව ඇත. වරල්පත්වල යටි පැත්ත සුදු හෝ එයට හුරු ලා පැහැයක් ගනී. බඩවත ද එවැනිම වූ අඳුරු අව පැහැයකින් සමන්විතය.

ඇන්ටාක්ටික් ප්‍රදේශය, උතුරු පැසිපික් සහ උතුරු අත්ලාන්තික් සාගර වල සිසිල් ජලයේ ඇති ඉතා සියුම් ජීව ද්‍රව්‍යයක් හේතුවෙන් එහි සිටින නිල් තල්මසුන්ගේ බඩවත කහ පැහැයට හුරු කොළ පැහැයක් ගෙන තිබේ.

මේ පැහැය නිසාම කලක් නිල් තල්මසුන්හට "සල්ෆර් බඩවතක් ඇත්තා" Sulper Bottom යන නාමය පටබැඳී ඇත.

## වරල්පත් හා පෙඳය

අනෙක් මාළුන්ගේ බඳ පෙදෙසෙහි පැහැදිලිව පෙනෙන ආකාරයේ වරල්පත් යුගලක් නිල් තල්මසාට නැත. එහෙත් හිසේ සිට දිගින් හතරෙන් තුනක් පමණ ගිය පසු සිරුර මත කුඩා ත්‍රිකෝණාකාර දකැත්තක දැති මෙන් වක්වූ කුඩා වරලසක් නිල් තල්මසාගේ සිරුරේ තිබෙනු දකිය හැක. මෙම වරලේ උසම ස්ථානය ගත් විට එය සිරුරේ සිට අඩියක් එනම් සෙන්ටිමීටර 30 ක් පමණ උසින් යුක්ත වේ. දියෙහි පිහිනා යාම පහසු කරවීම සඳහා ක්‍රමයෙන් සිහින් වෙමින් යන කුඩා වරල් සිරුරේ දෙපස පිහිටා තිබේ. ඒවා කුඩාය. එය සිරුරේ මුළු බරින් හා දිගින් 12 % ප්‍රමාණයකි. නිල් තල්මසෙකුගේ පෙඳය හෙවත් වල්ගය ත්‍රිකෝණාකාර හැඩයකින් යුක්ත ඉතා විශාල පුළුල් වූවකි.

## දිග හා බර

සාමාන්‍යයෙන් නිල් තල්මසෙකුගේ දිග අඩි 75 ත් 80 ත් අතර අගයක් ගනියි. බර ටොන් 110 ක් පමණය. කිලෝග්‍රෑම් නම් 99.800 කි. එකම වයසේ පිරිමි නිල් තල්මසෙකුට වඩා ගැහැනු තල්මසෙකු විශාලත්වයෙන් වැඩිය. ඇතැම් විට එවැනි විශාල නිල් තල්මසෙක් ටොන් 150 ක් පමණ වන අතර කිලෝග්‍රෑම් නම් 136,000 කි.

## ආහාර පුරුදු

නිල් තල්මසා ලොව වෙසෙන විශාලතම සත්වයා වුව ද ආහාරය සඳහා ගන්නේ සෙන්ටිමීටරයක් තරම් වූ කුඩා ඉස්සන් හා එවැනි පොතු සහිත කුඩා මුහුදු සත්ව විශේෂයනුයි. ශීත කාලයේදී කෙනෙකු මවිත කරන අන්දමින් ටොන් හතරක පමණ ඉස්සන් ප්‍රමාණයක් තල්මසෙකුට එක වරකට ගිල දැමිය හැක. මෙයින් අදහස් වන්නේ දිනකට මොවුන් මිලියන 40 ට ආසන්න ඉස්සන් ප්‍රමාණයක් ගිල දමන බවයි. බැලින් නම් තල්මස් විශේෂයට අයත් තල්මසුන්සේම මොවුන්ගේ විශාල මුඛයේ ද උඩු හනුවේ දත් වෙනුවට එක මත එක

පිහිටා තිබෙන කෙඳි වැනි වැටියක් තිබේ.

එයට කෙඳි 200 - 400 ත් අතර ප්‍රමාණයක් අයත් වෙයි. මේවා කළු පැහැතිය. අගල් 20 ක් පමණ එනම් සෙන්ටිමීටර් 51 ක් තරම් දත් වැටියේ සිට මුඛයේ ඉදිරිපස වන තෙක් පළලින් යුක්තය. අගල් 40 ක් පමණ දිගය. ටොන් ගණනක ආහාර ප්‍රමාණයක් එකවර මුව තුළට ගෙන මුඛයේ ඇති කෙඳි වැනි වැටිය තුළින් වතුර කඳ පිටට මුදා හැර ආහාර මුඛයේ රඳවා ගනියි. මෙම ක්‍රියාවලිය අප එදිනෙදා ජීවිතයේදී ඇතැම් දේ පෙරණයකින් පෙරා භාවිතයට ගන්නා ක්‍රියාවලියට බෙහෙවින් සමානය.

## සංවාසය හා ප්‍රජනනය

මෑතදී කළ පර්යේෂණ වලින් අනාවරණය වී තිබෙන්නේ නිල් තල්මසුන් වයසින් අවුරුදු 6 ක් හෝ 7 ක් හෝ පිරිමි තල්මසෙකුගේ දිග අඩි 74 (මීටර 23) ක් සහ ගැහැනු සතෙකු අඩි 19 ක් (මීටර 24 ) වූ පසුව ලිංගික පරිණතියට පත්වන බවයි.

ගැහැනු නිල් තල්මසෙකුට වසර දෙකින් දෙකට හෝ තුනකින් තුනකට පැටවුන් බිහි කළ හැකි අතර ගර්භනී කාලය මාස 12 කි. උපතේදී නිල් තල්මස් පැටවෙක් අඩි 23 සිට 27 දක්වා දිගකින් ද ටොන් තුනක් එනම් කිලෝග්‍රෑම් 2722 ක පමණ බරකින් යුක්ත වේ. ඉපදී මාස 7 ක් හෝ 8 ක් යනතුරු මවගෙන් කිරි උරා බොමින් පෝෂණය වන පැටවුන් දිගින් අඩි 52 ක් (16m) වූ පසුව කිරි වැරීම සිදු කරයි.

එම අවස්ථාව වන විට සාමාන්‍ය තල්මස් පැටවෙකුගේ බර ටොන් 23 ක් පමණ වේ. මවගෙන් පෝෂණය වන අවධියේ දී ප්‍රෝටීන බහුල මවගේ කිරි ලීටර 379 ක් එනම් ගැලුම් නම් 100 ක් සෑම දිනකම උරා බොන පැටවුන් අතර එයින් රාත්තල් 200 ක බරක් හිමිකර ගනියි. සෑම තල්මස් පැටවෙකුගේම සෑම පැයකයම රාත්තල් 8 ක් බර වැඩිවන අතර දිනකටම අගල් 1 1/2 ක් දිගින් වැඩෙයි.

## ව්‍යාප්තිය

ලෝකයේ තිබෙන සෑම සාගර කලාපයකම පාහේ නිල් තල්මසුන් දැකිය හැක. ශීත ඍතුවේදී උෂ්ණ කාලාපීය ජලයේ සංවාසයේ සහ ප්‍රජනන කාර්යයේ සහ පැටවුන් ඇති දැඩි කිරීමේ යෙදෙන නිල් තල්මසුන් හේමන්තයේ දී ආහාර ලබාගැනීම සඳහා ධ්‍රැව ආසන්න ප්‍රදේශ කරා යයි.

## ස්වාභාවික ඉතිහාසය

නිල් තල්මසුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් සිටිනු දැකිය හැක. සාමාන්‍යයෙන් මොවුන් යුගලයක් ලෙස ජීවත් වෙයි. කණ්ඩායමක් ලෙස සිටින ඇතැම් අවස්ථාවලදී එක කණ්ඩායමක නිල් තල්මසුන් 50 ක් 60 ක් සිටිනු දැකගත හැක. මොවුහු වේගවත් පිහිනුම් ශූරයෝ වෙති. බියට පත්වූ අවස්ථාවකදී පැයට කිලෝ මීටර 48.3 ක වේගයෙන් පිහිනා යන්නට නිල් තල්මසුන්ට හැකියාව ඇත. සාමාන්‍යයෙන් මොවුන් මුහුදේ එහා මෙහා ගමන් කරන්නේ පැයට කිලෝමීටර 19.3 ක වේගයකිනුයි.

## නිල් තල්මසුන්ගේ ඉරණම

විශාල සිරුරත් වේගයෙන් පිහිනායාමේ හැකියාවත් නිසා "එක්තරා කාලයක්" නිල් තල්මසුන් හට ජීවත් වීම පිළිබඳ ප්‍රශ්නයක් මතුව තිබුණේ නැත. "එක්තරා කාලයක්" ලෙස සඳහන් කරනුයේ, ඇටවුම් බිලි දමා තල්මසුන් දඩයම් කිරීමට මිනිසුන් නොදැන සිටි කාලයයි. 1868 වසරේදී නෝර්වීජියානු ජාතික ස්වෙන් හොයින් නමැත්තා සොයාගත් මෙවලමක් නිසා නිල් තල්මසුන් ගත කළ වාසනාවන්ත කාල පරිච්ඡේදයට නැවතීමේ තිත තබන්නට සිදු විය. පසු කාලයක වාෂ්ප බලයෙන් හා ඩීසල් බලයෙන් ධාවනය කළ හැකි විශාල නැව් හා මසුන් ඇල්ලීමට පටන් ගැනීමත් වෙඩි බෙහෙත් යොදා සකස් කළ ඇවුලුම් තුවක්කු සෑදීමත් නිල් තල්මසුන් මරන්නන්ගේ ජාවාරම දියුණු තියුණු කරන්නට සමත් විය.

අඩි 90 ක් දිග එක් තල්මසෙකුගෙන් තෙල් බැරල් 120 ක් පමණ සපයා ගත හැකි වූ නිසා දස දහස් ගණනින් නිල් තල්මසුන් මරා දමනු ලැබීය. 1931 වන විට මේ තත්වය තව .තවත් උග්‍ර අතකට හැරෙමින් පැවතිණ. එක් වසරක එක් කාර්තුවකට එනම් මාස 3 කාලයකට නිල් තල්මසුන් 29,000 කට අධික ප්‍රමාණයක් ඝාතනයට ලක්විය. මෙම සමය ලෝක ඉතිහාසයේ කළු පැල්ලම් රාශියක් තැබූ i හා iiවන ලෝක යුද්ධ සමයයි. ස්වාභාවික සම්පත් වර්ධනය වීමට ගතවන කාලයට වඩා වැඩි වේගයකින් ඒවා පරිභෝජනය කිරීමට මිනිසා පුරුදු වන්නේ මේ කාලයේදී යි. වඳවී යන සතුන්ගේ රතු ලැයිස්තුවට නිල් තල්මසාගේ නම ඇතුළත් වූ පසුව වෙනත් තල්මස් විශේෂයන් තම කුරුමානම බවට පත් කර ගැනීමෙන් ම මිනිසාගේ ම්ලේච්ඡත්වය හොඳින්ම ඔප්පු කර පෙන්වයි.

කෙසේ වුවත් 1966 දී පමණ නිල් තල්මසුන් මැරීම සපුරා තහනම් කරමින් අන්තර් ජාතික නිල් තල්මසුන් මැරීම පිළිබඳ කොමිසම International Whaling CommissionIWC ලෝකය පුරා බලපවත්වන ආකාරයේ ආරක්ෂාවක් නිල් තල්මසුන් ඇතුළු අනෙක් විශේෂයන්ට ද ලබාදීමට කටයුතු කළේය. ලෝකයේ සාගරවල වෙසෙන මත්ස්‍යයන්ගෙන් හතරෙන් තුනක්ම මිනිසුන් අල්ලා ගන්නේ උන්ට යළිත් බෝවීමට ඇති ඉඩකඩ අහිමිවන ආකාරයෙනි.

නිල් තල්මසුන් හටද මෙම ඛේදවාචකයම අත්පත් විය. ඝාතනය කිරීම තහනම් කළ ද නිල් තල්මසුන්ගේ ගහණයේ ශීඝ්‍ර වර්ධනයක් මෙකල සිදුවූයේ නැත. දළ වශයෙන් 2,,000,000 ට ආසන්න නිල් තල්මසුන් ප්‍රමාණයක් ජාවාරම්කරුවන් අතින් ඝාතනයට ලක්ව ඇතැයි ගණන් බලා තිබේ.

ලොව පුරා සාගරවල විසිර පැතිර සිටි නිල් තල්මසුන් ප්‍රමාණය අදවන විට 5000 ක් දක්වා අඩුවී තිබේ. මෙම ගහණය ද ජීවත් වන්නේ උතුරු අත්ලාන්තික් සාගරයේත් උතුරු පැසිපික් සාගරයේත් දකුණු අර්ධ ගෝලයේ ඇතැම් ස්ථානවලත් පමණි.

ඇවිල යන්නට මාන බලමින් තිබෙන යුද ගින්දර ඇවිල ගියහොත් තෙල් මිල ඉහළ යන බව විද්වතුන්ගේ මතයයි. එසේ වුවහොත් තෙල් වෙනුවට වෙනත් විකල්ප තෙල් සොයා ගැනීමක් කෙරේ අනිවාර්යයෙන්ම පර්යේෂකයන් යොමුවනු නියතය. අවසරයෙන් හෝ අනවසරයෙන් සොබා දහම වෙත කුරුමානම් අල්ලන මිනිසුන්ගේ රකුසු ඇස් නැවතත් ටොන් ගණන් තෙල් ලබා ගත හැකි තල්මසුන් වෙත යොමු නොවේ යැයි කවරෙකුට නම් කිව හැකි වේද? ❑

**තිළිනි රත්නායක**

**විශාල සිරුරත් වේගයෙන් පිහිනායාමේ හැකියාවත් නිසා "එක්තරා කාලයක්" නිල් තල්මසුන් හට ජීවත් වීම පිළිබඳ ප්‍රශ්නයක් මතුව තිබුණේ නැත. "එක්තරා කාලයක්" ලෙස සඳහන් කරනුයේ, ඇටවුම් බිලි දමා තල්මසුන් දඩයම් කිරීමට මිනිසුන් නොදැන සිටි කාලයයි. 1868 වසරේදී නෝර්වීජියානු ජාතික ස්වෙන් හොයින් නමැත්තා සොයාගත් මෙවලමක් නිසා නිල් තල්මසුන් ගත කළ වාසනාවන්ත කාල පරිච්ඡේදයට නැවතීමේ තිත තබන්නට සිදු විය. පසු කාලයක වාෂ්ප බලයෙන් හා ඩීසල් බලයෙන් ධාවනය කළ හැකි විශාල නැව් හා මසුන් ඇල්ලීමට පටන් ගැනීමත් වෙඩි බෙහෙත් යොදා සකස් කළ ඇවුලුම් තුවක්කු සෑදීමත් නිල් තල්මසුන් මරන්නන්ගේ ජාවාරම දියුණු තියුණු කරන්නට සමත් විය.**